# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 45 — 1973 පෙබරවාරි 02 වැනි සිකුරාද — 1973.02.02**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV වැනි කොටස—පළාත් පාලනය

**(මෙහි වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් කාණ්ඩයකට වෙන වෙනම පිටු අංක සලසා ඇත)**


| | පිට | | පිට |
|---|---|---|---|
| **පළාත් පාලන නිවේදන** ... ... ... | 163 | **ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන** ... ... | 170 |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 165 | **අය-වැය ලේඛන** ... ... ... | 172 |
| විභාග, **විභාග ප්‍රතිඵල ආදිය** ... ... ... | — | **දේපල විකිණීම** ... ... ... | 184 |
| **අතුරු ව්‍යවස්ථා** ... ... ... | 169 | **මාර්ග ගොනුමිටි දැන්වීම** ... ... ... | — |
| පළාත් **පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම** ... | — | **විවිධ දැන්වීම** ... ... ... ... | 185 |


සැලකිය යුතුයි.—සිවිල් නඩුවිධාන සංග්‍රහ (සංශෝධන) පනත් කෙටුම්පත සහ කාර්මික ආරාවුල් (විශේෂ බිධිවිධාන) පනත් කෙටුම්පත 1973 ජනවාරි 26 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේක වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

අවිස්සාවේල්ල නගර සභාව

නගර සභා ආඥාපනත

**1973 වර්ෂය සඳහා දේපළ බද්ද**

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් දෙන ලද අනුමැතිය ඇතිව අවිස්සාවේල්ල නගර සභාව විසින් අවිස්සාවේල්ල නගරය තුළ පිහිටි කුඹුරු ඉඩම් හැර සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් පහත සඳහන් ප්‍රමාණවල බද්දක් සභාව විසින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්, සුදුසුකම් හා කොන්දේසිවලට යටත්ව පිළිවෙලින් 1973 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය යුතු වන පරිදි 1973 වර්ෂය සඳහා ඒ වගන්තිය යටතේ පනවන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(අ) කොට්ඨාශ අංක 1 කුඩගම, අංක 2 මානික්කවත්ත, අංක 10 කිරිවන්දල, අංක 11 පූවක්පිටිය යන කොට්ඨාශවල පිහිටි සියළුම නිශ්චල දේපලවල සහ අංක 4 සීතාලෙන යන කොට්ඨාශයේ පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 149 සිට 191 දක්වා වූ දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අටක බද්දක් සහ,

(ආ) කොට්ඨාශ අංක 3 කඩමන්ඩිය, අංක 5 සීතාවක, අංක 6 මාලිගාව, අංක 7 ආරධනා කන්ද, අංක 8 ගලපිටමඩම, අංක 9 සීතාකන්ද යන කොට්ඨාශවල පිහිටි සියළුම නිශ්චල දේපලවල සහ අංක 4 සීතාලෙන යන කොට්ඨාශයේ පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 149 සිට 191 දක්වා වූ දේපල හැර අනෙක් සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දොළහක බද්දක්.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ දීය.

2-116 —73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියලුම දැන්වීම් ඒවා එවන ලද අයවෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1971 මාර්තු මස 19 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

163—70799—5,618 (73/1)

## උඳුරුව කෝරළේ ගම් සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ උඳුරුව කෝරළේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ ඒ වගන්තියේ (2) වැනි උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

#### යෝජනාව

"(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගම්සභාව විසින් සභාවේ පාරිපාලන සීමා ඇතුළතවූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර ඇති පරිදිවූ) විනෝද බදු කටයුතු සඳහා ප්‍රවේශ වීම පිණිස අයකරනු ලබන ගෙවීම් වලින්, මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල | බදු ප්‍රමාණය රු. ශ. |
|---|---|
| බදු ප්‍රමාණය හැර ප්‍රවේශ ගාස්තුව— | |
| (අ) ශත 20කට අඩු නොවන නමුත් ශත 50කට වැඩි නොවන ... ... ... | 0 05 |
| (ආ) ශත 50 කට වැඩි නමුත් රු. 1.00 කට වැඩි නොවනවිට | 0 10 |
| (ඇ) රු. 1.00කට වැඩි නමුත් රු. 1.50 කට වැඩි නොවන විට ... ... | 0 15 |
| (ඈ) රු. 1.50කට වැඩි නමුත් රු. 2.00කට වැඩි නොවන විට ... ... | 0 20 |
| (ඉ) රු. 2.00 කට වැඩි නමුත් රු. 3.00 කට වැඩි නොවන විට ... ... | 0 30 |
| (ඊ) රු. 3.00කට වැඩි නමුත් රු. 4.00කට වැඩි නොවන විට ... ... | 0 40 |
| (උ) රු. 4.00කට වැඩි නමුත් රු. 5.00කට වැඩි නොවන විට ... ... ... | 1 0 |
| (ඌ) රු. 5. 00කට වැඩි නමුත් රු. 10.00කට වැඩි නොවන විට ... ... | 1 0 |
| (එ) රු. 10.00කට වැඩිවන විට— | |
| (1) පළමුවැනි රු. 10.00ට ... | 1 0 |
| (2) එක් එක් අතිරේක රු. 5.00ට හෝ ඉන් කොටසකට ... ... | 1 0 |

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්.

1972 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ දීය.

2-904—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## 265 වන අධිකාරය වන පළාත් පාලන (පාලන ප්‍රදේශ) ආඥාපනත

පහත සඳහන් පත්වීම් කර ඇති බැව් නිවේදනය කරනු ලැබේ :—

ලංකා පරිපාලන සේවයේ 2 වැනි පන්තියේ එම්. බී. සමරකෝන් මහතා 1972 සැප්තැම්බර් මස 23 වන දින සිට නැවත නියම යක් කරනතුරු මහනුවර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

ලංකා පරිපාලන සේවයේ 3 වැනි පන්තියේ පී. බී. විල්සන් මහතා 1972 සැප්තැම්බර් මස 18 වැනි දින සිට නැවත නියම යක් කරනතුරු මාතර ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වශයෙන්.

නුවරඑළිය ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලංකා පරිපාලන සේවයේ 2 වැනි පන්තියේ එල්. ජී. සිරිවර්ධන මහතා සිය රාජකාරිවලට අතිරේකව 1972 සැප්තැම්බර් මස 14 වැනි දින සිට, ලංකා පරිපාලන සේවයේ ටී. අයි. කමල්දීන් මහතා නැවත රාජකාරි බාරගන්නා තුරු බදුල්ල ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස් තනතුරේ වැඩබැලීමට.

පී. සිරිවර්ධන,
අතිරේක ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.

1972 දෙසැම්බර් මස 14 වන දින,
කොළඹ දී ය.

2-38—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## මාදම්පේ සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

#### 1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ මාදම්පේ සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම් වලට යටත්ව මාදම්පේ නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුන බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 ජනවාරි 8 වැනි දින,
කොළඹ දී ය.

2-980—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

#### 1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ ගලේවෙල සුළු නගර සභාව විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම් වලට යටත්ව ගලේවෙල නගරය තුළ පිහිටා ඇති සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට තුන බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 ජනවාරි 8 වැනි දින,
කොළඹ දී ය.

2-979—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**ගම්සභා ආඥාපනත**

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥාපනතේ 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ලේකම්වසම් ගොඩවින් සිරිවර්ධන වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ මැදපළාත ගම්සභාවේ අංක 11 දරණ කොට්ඨාශයේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ ලුනුවත්තේ ගෙදර පුංචි අප්පුහාමි මහතා ගම්සභාවට දැන්වීමක් නොකර පිළිවලින් ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරාපත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමකට පත්ව නුවරඑළිය දිස්ත්‍රික්කයේ මැදපළාත ගම්සභාවේ අංක 11 දරණ කොට්ඨාශයේ නියෝජිත රත්නායක මුදියන්සේලාගේ ලුනුවත්තේගෙදර පුංචි අප්පුහාමි මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එල්. ජී. සිරිවර්ධන,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1973 ක්වූ ජනවාරි මස 20 වන දින,
නුවරඑළිය, පළාත් පාලන කාර්යාලයේ දිය.

2-128—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිළධාරීතැනගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනාථදරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිළධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට 8ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස ශම් තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(ඊ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(උ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(ඌ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් ව සිටිය යුතුයි.

(එ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුය.

4. **පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු**—(i) අදල පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දනට පවත්නා වූත් හෝ මින් මතු සම්පාදනය කළ හැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශෙෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් ස්වකීය ආධුනික වැඩ පරීක්ෂණ කාල පරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු නියමිත වැටුප් වැඩිවීම නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීනතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

(v) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදල නොවේ.)

**සටහන.**—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ට ය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට සුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානමව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් කැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැතිවූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ කුමුම ඒ අවදානමට මුහුණ පාති.

**අත්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය**

**පළාත් පාලන සේවය**

**සැ.යු.**—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ.පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තිය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———————————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————.
(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම අංකයත් සඳහන් කරන්න.)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.
අවුරුදු :————, මාස :————, දින :————.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය**

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)—

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :—

(ii) දෙමළ :—

(iii) ඉංග්‍රීසි :—

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—හේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණ භාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්:—ගැසට් නිවේදනයෙහි සඳහන්නොවූ ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමලුය් ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————,

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### I වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරාගනු ලැබෙන අයදුම්කරු පළමුවන වරට මහනුවර නගර සභාවට පත් කරනු ලැබේ.

2. මෙම තනතුර ස්ථිරය. පත් වීම් අර්ථසාධක අරමුදලක් පදනම් කෙරෙන අතර, අවුරුදු 3 ක පරිවාස සේවා කාලයකින් ද යුක්ත වන්නේ ය.

3. මෙම තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් පරිමාණය අවුරුද්දකට රු. 3,240—12×60—3,960 කි. රජයේ දීමනා ප්‍රමාණයන්ට අනුව විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම්:

(අ) 1973.03.02 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. (දැනට පළාත් පාලන සේවයෙහි සාමාජිකයින් වන සහ පළාත් පාලන ආයතනයන්හි සේවකයින් වන අයදුම්කරුවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.)

(ආ) (i) කියවීමට, ලිවීමට සහ වාර්තා තබා ගැනීමේ හැකියාවක් තිබිය යුතුය.

(ii) දුනුවායන් තලන නිවැරදි ක්‍රමය හා යෝග්‍ය තන්හි ඒවා පණ පෙවීම් යනාදිය පිළිබඳව පුහුණු 2 වන ශ්‍රේණියේ මට්ටමමේ හැකියාවක් තිබිය යුතුය.

(ඇ) (i) පළාත් පාලන සේවයේ 2 වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරුවෙකු ලෙස අවුරුදු 8 ක පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

(ii) පළාත් පාලන සේවයේ 2 වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරුවෙකු ලෙස අඩුම වශයෙන් අවුරුදු 3 ක සේවයක් සහ පිළිගත් අයතනයක I වන පංතියේ වෘත්තියෙකු ලෙස යටත් පිරිසෙයින් අවුරුදු 6 ක සේවයක් තිබිය යුතුය.

නැතහොත්

(iii) පිළිගත් ආයතනයක 1 වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරුවකු ලෙස සහ පළාත් පාලන සේවයෙහි 2 වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරුවකු ලෙස යටත් පිරිසෙයින් අවුරුදු නවයක (9) පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්

(iv) පිළිගත් ආයතනයක 1 වන ශ්‍රේණියේ පුහුණු කම්මල් කරුවකු ලෙස යටත් පිරිසෙයින් අවුරුදු හයක (6) පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන.— (1) ඉහත (ii), (iii) සහ (iv) සඳහන් පෞද්ගලික ආයතනයන් හි සේවය සහතික මගින් සනාථ කළයුතු අතර, **එම සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුයි.**

(2) ඉහත (iii) සඳහන් සේවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ගෙන් ලැබෙන අයදුම්පත් සලකා බලනු ලැබෙනුයේ ඉහත (i) සහ (ii) සඳහන් සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් නොලැබුණහොත් පමණි.

ඉහත (iv) සඳහන් සේවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ගෙන් ලැබෙන අයදුම්පත් සලකා බලනු ලැබෙනුයේ අනෙකුත් සුදුසුකම් සහිත අයගෙන් අයදුම්පත් නොලැබුණහොත් පමණකි.

(ඇ) අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත වූවන් විය යුතුයි.

(පළාත් පාලන සේවයෙහි සාමාජිකයන් නොවන හෝ පළාත් පාලන ආයතනයක සේවය නොකරන අයදුම්කරුවන්, තම චරිතය සම්බන්ධයෙන් වැදගත් පුද්ගලයින් දෙදෙනකුගෙන් ලබාගත් චරිත සහතික තම අයදුම්පතට අමුණා එවිය යුතුය.)

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1973.03.02 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි 13 වැනි ශීර්ෂය වෙනුවට, මේ කරුණු යොදා ගන්න :—

"13 (අ) ද්‍රුනුවාතේ තලන නිවැරදි ක්‍රමය හා ඒවා පණ පෙවීම යනාදිය පිළිබඳව 2 වන ශ්‍රේණියේ මට්ටමේ හැකියාව :

————.

(ආ) පළපුරුද්ද :————.

උප්පැන්න සහතිකය සහ අනිකුත් සහතිකවල පිටපත් (මුල් සහතික නොව) අයදුම්පතට අමුණා එවිය යුතුයි. මේ ලියවිලිවල පිටපත් නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලන සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණ බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. තෝරාගනු ලබන අපේක්ෂකයා තමන් පත් කරන පළාත් පාලන ආයතනයේ සීමාව තුළ පදිංචිවීමට අවශ්‍ය විය හැකිය.

10. අවශ්‍ය සුදුසුකම් ඇති ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 ජනවාරි මස 20 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

02–59—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

පළාත් පාලන සේවය

2 වන ශ්‍රේණියේ වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී තනතුර

(නාගරික ක්ෂුද්‍රජීව විද්‍යාඥගේ රසායනාගාරය)

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලබන අයදුම්කරු/කාරිය පළමුවරට කොළඹ නාගරික සභාවට පත් කරනු ලැබේ. ඔහු/ඇය මාරුවීමට යටත් වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් ව සිටිය යුතුය.

3. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 3,864 න් පටන් ගෙන, වර්ෂයකට රු. 144 බැගින් 18 වරක් වැඩිවී රු. 6,456 දක්වා නගී. එහි වර්ෂයකට රු. 4,584 හා රු. 5,736 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත. රජයේ නිලධාරීන්ට අදාල ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) 1973.03.02 දිනට වයස අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය. (පළාත් පාලන සේවයේ නොවන අයදුම්කරුවන්ට)

(ආ) අයදුම්කරුවෝ රසායන විද්‍යාව හා පහත සඳහන් වන විෂයයන්ගෙන් එකක් සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනකදී රසායන විද්‍යාව සම්මාන සහිතව සහ පහත සඳහන් විෂයයන්ගෙන් එකක් සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට ඉහල විභාගයකින් සමත් වී සිටිය යුතුයි.

(භෞතික විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, සහ ජීව විද්‍යාව) පිළිගත් රසායනාගාරයක පුහුණුව හා පළපුරුද්ද ලබා ඇති අයදුම්කරුවන් ගැන විශේෂයෙන් සලකනු ලැබේ.)

5. තනතුර ස්ථිරය. අර්ථ සාධක අරමුදලක් පදනම් කරගෙනය.

6. තෝරාගනු ලැබූ අයදුම්කරු, ඒ වන විට පුහුණුව ලබා නැත්නම් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පුහුණුවක් ලැබීමටත්, පුහුණුවෙන් පසුව අවුරුදු 3 ක කාලපරිච්ඡේදයක් පළාත් පාලන සේවයෙහි සේවය කරනා බවට ගිවිසුමකට බැඳීමටත් නියමකරනු ලැබේ. අයදුම්කරු පුහුණුවී අවසානයෙහි ඇති පරීක්ෂණයෙන් අසමත් වූවහොත්, ඔහුගේ/ඇයගේ සේවය නතර කළ හැකිය.

7. ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ සමත් පළාත් පාලන සේවයෙහි හා රජයේ සේවයෙහි තුන් අවුරුදු සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර ඇති රසායනාගාර කාර්මික ශිල්පීන්ගෙන් හා උප රසායනාගාර සහකාර නිලධාරීන්ගේ ඉල්ලීම් පත්‍ර ද භාරගනු ලැබේ.

8. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුව පිළියෙල කොට, 1973.03.02 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබෙන්නට එවිය යුතුයි. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි පහත සඳහන් යටතේ දැක්වෙන කරුණු වෙනුවට, පහත සඳහන් කොට ඇති කරුණු යොදා ගත යුතුයි:—

"8. අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සමත් වූ විභාගයෙන් නම්, සමත් වූ විෂයයන් සඳහන් කරන්න. ලබා ඇති උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි

11. විශේෂ පුහුණුවක්, සුදුසුකම් හෝ පළපුරුද්දක් වෙයි නම් ඒ පිළිබඳ විස්තර :————.

12. රසායනාගාර වැඩ පිළිබඳ පළපුරුද්ද :————.

10. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

11. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

12. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1973 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

2–60—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී.—බී. 7/66.

බදුල්ල මහ නගර සභාව

මහ නගර සභා ආඥාපනත

(252 වැනි අධිකාරය වන) මහ නගර සභා ආඥාපනතේ 267 වැනි සහ 272 වැනි වගන්ති යටතේ බදුල්ල මහ නගර සභාව විසින් සාදනු ලැබ, ඒ ආඥාපනතේ 268 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

1972 නොවැම්බර් 18 වැනි දින,
කොළඹ දීය.

අතුරු ව්‍යවස්ථාව

1937 මැයි මස 7 වැනි දින අංක 8,288 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව 1958 මැයි මස 23 දින අංක 11,318 දරන ගැසට් පත්‍රයේ පළ කරණ ලද අතුරු ව්‍යවස්ථාවෙන් අවසන් වරට සංශෝධනය කරණු ලැබූ, ජල කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථා, පහත සඳහන් ආකාරයට මෙයින් තවදුරටත් සංශෝධනය කරණු ලැබේ :—

(1) 37 වැනි අතුරු ව්‍යවස්ථාවේ—

(අ) එහි (2) වැනි ඡේදයෙහි (අ) අනුඡේදයේ සඳහන් "7.50" යන යෙදුම ඒ අනුඡේදයේ යෙදෙන කවර හෝ ස්ථානයක වුවද ඒ වෙනුවට "12.50" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි (2) වැනි ඡේදයෙහි (ආ) අනුඡේදයේ සඳහන් "12.50" යන යෙදුම ඒ අනුඡේදයේ යෙදෙන කවර හෝ ස්ථානයක වුවද ඒ වෙනුවට "17.50" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) 38 වැනි අතුරු ව්‍යවස්ථාවේ—

(අ) එහි (4) වැනි ඡේදයෙහි (අ) අනුඡේදයේ සඳහන් "15.00" යන යෙදුම වෙනුවට "20.00" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එහි (4) වැනි ඡේදයෙහි (ආ) අනුඡේදයේ සඳහන් "15.00" යන යෙදුම වෙනුවට "20.00" යන යෙදුම ආදේශ කිරීමෙන්.

2–153—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. ජී.—බී. 18/67.

උරුම්පිරායි-උරෙලු සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි හා 156 වැනි වගන්ති යටතේ උරුම්පිරායි-උරෙලු සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එම ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්.

1973.01.23 දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථා

පොදු වෙළඳ පොලවල්

1. උරුම්පිරායි-උරෙලු සුළු නගර සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XV වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වෙළඳපල ප්‍රදේශය, සභාවේ පාලන සීමාවන් ඇතුළත පිහිටා තිබෙන ප්‍රදේශය විය යුතුය.

2. සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XV වැනි කොටසේ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයක් සඳහා වෙළඳපලේ යම්කිසි බිම් ප්‍රමාණයක් පාවිච්චි කිරීම සඳහා හෝ ප්‍රයෝජනයට ගැනීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් පනවා අය කළ යුතුය :—

| | | දිනකට ගාස්තුව රු. | ශත |
|---|---|---|---|
| (1) මාළු වෙළඳ පොලෙහි— | | | |
| (අ) සිමෙන්ති යෙදූ බිමෙහි වර්ග යාර එකක එක් එක් බිම් ප්‍රමාණය සඳහා | ... | 0 | 25 |
| (ආ) සිමෙන්ති නොයෙදූ වර්ග යාර එකක එක් එක් බිම් ප්‍රමාණය සඳහා | ... | 0 | 15 |
| (2) එළවලු වෙළඳ පොලෙහි— | | | |
| (අ) සිමෙන්ති යෙදූ බිමෙහි වර්ග යාර එකක එක් එක් බිම් ප්‍රමාණය සඳහා | ... | 0 | 20 |
| (ආ) සිමෙන්ති නොයෙදූ බිමෙහි වර්ග යාර එකක එක් එක් බිම් ප්‍රමාණය සඳහා | | 0 | 10 |

2–152—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## ජාඇල නගර සභාව

### 1970 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශනය

| බැරකම් | රු. ශ. |
|---|---|
| තැන්පත් | 1,13,415 98 |
| ක්‍රීඩා භූමි සඳහා රජයේ ආධාර | 2,857 0 |
| පුස්ථකාල සඳහා රජයේ ආධාර | 1,433 04 |
| විදුලිය දෙපාර්තමේන්තුවේ ක්ෂය සංචිතය | 39,578 18 |
| | 1,57,284 20 |

| වත්කම් | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අත්තිකාරම් | | 13,227 45 |
| අත්තිකාරම් නිවාස යෝජනා ක්‍රමය සඳහා ඉඩම් ලබාගැනීමට කොළඹ දිසාපති වෙත යවා ඇති මුදල | | 30,734 80 |
| ලංකා ඉතිරි කිරීමේ බැංකුව | | 250 00 |
| මුදල් ශේෂය | | |
| බැංකුවේ ඉතිරි මුදල | 5,411 09 | |
| අත ඉතිරි | 1,973 64 | |
| සුළු මුදල් | 100 0 | |
| | | 7,484 73 |
| 1970 වර්ෂයේ ආදයම | 5,97,016 81 | |
| 1970 වර්ෂයේ වියදම | 5,94,707 95 | |
| 1970 වර්ෂයේ අතිරික්තය | 2,308 86 | |
| 1969.12.31 දිනට ඌණතාවය | 1,07,896 08 | |
| 1970 වර්ෂයේ අතිරික්තය අඩුකළා | 2,308 86 | |
| 1970.12.31 දිනට ඌණතාවය | | 1,05,587 22 |
| | | 1,57,284 20 |

ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් දොන් ඩයනිසියස් හේමචන්ද්‍ර සූරියආරච්චි වන මම, මගේ විශ්ව සයේ හා දැනීමේ හැටියට ඉහත සඳහන්ව ඇති 1970.12.31 දිනට ජාඇල නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සැබෑ හා නිවැරදි බවට සහතික කරමි.

ඩී. ඩී. එච්. සූරියආරච්චි,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස්.

1971 ඔක්තෝබර් මස 12 දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඒ. සිරිල් සිල්වා,
සමාදාන විනිශ්වයකාරතැන.

1971.10 12 දින,

ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

### 1970 වර්ෂයේ ආදයම් හා වියදම් පිළළිබඳ ප්‍රකාශනය

| ආදයම | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම් | 2,17,087 22 |
| බී.—මහා මාර්ග | — |
| සී.—තානායම් සහ අම්බලම් | 11,618 19 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | 11,109 50 |
| ඊ.—මහජන සෞඛ්‍යය | 83,911 74 |
| ඇෆ්.—මහජන විනෝදය | 21,978 80 |
| ජී.—සුසාන භූමි | — |
| එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම | 35 50 |
| ජේ.—විදුලිබල කායර්‍යාංශය | 2,50,416 72 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල | 859 14 |
| මුළු එකතුව | 5,97,016 81 |
| **වෙනත් ලැබීම්** | |
| තැන්පත් | 47,750 54 |
| අත්තිකාරම් | 27,233 44 |
| පුස්තකාල සංවර්ධන ආධාර | — |
| ලැබීම් එකතුව | 6,72,000 79 |
| 1969.12.31 දිනට ඉතිරි | 14,815 38 |
| | 6,86,816 17 |

| වියදම | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් | 1,10,963 22 |
| බී.—මහා මාර්ග | 62,305 22 |
| සී.—තානායම් සහ අම්බලම් | 4,882 33 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි | 17,509 09 |
| ඊ.—මහජන සෞඛ්‍යය | 1,57,885 20 |
| ඇෆ්.—මහජන විනෝදය | 360 0 |
| ජී.—සුසානභූමි | — |
| එච්.—බල්ලන් විනාශ කිරීම | 531 0 |
| ජේ.—විදුලිබලය සඳහා | 2,32,949 14 |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල | 7,322 75 |
| මුළු එකතුව | 5,94,707 95 |
| **වෙනත් ගෙවීම්** | |
| තැන්පත් | 48,619 64 |
| අත්තිකාරම් | 28,363 85 |
| තානායම් සංවර්ධන ආධාර | 7,500 0 |
| පුස්ථකාල ආධාර | 140 0 |
| ගෙවීම් එකතුව | 6,79,331 44 |
| 1970.12.31 දිනට ඉතිරි | 7,484 73 |
| | 6,86,816 17 |

ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් දොන් ඩයනිසියස් හේමචන්ද්‍ර සූරියආරච්චි වන මම, මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට නගරසභා ආඥාපනතේ (පරිච්ඡේදය 255) ප්‍රකාර, 1970 වර්ෂයේ ජාඇල නගර සභාවේ ආදයම් සහ වියදම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් වාර්තාවක් බවට ඉහත සඳහන් ප්‍රකාශය මෙයින් සහතික කරමි.

ඩී. ඩී. එච්. සූරියආරච්චි,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස්.

1971 ඔක්තෝබර් මස 12 දින මා ඉදිරිපිට ජාඇලදී සහතික කරන ලදී.

ඒ. සිරිල් සිල්වා,
සමාදාන විනිශ්වයකාර තැන.

1971 ඔක්තෝබර් මස 12 දින,
ජාඇල නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–147—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### 1971 දෙසැම්බර් මස 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත්— | | | |
| සාමාන්‍ය ... ... | 3,846 78 | | |
| විදුලිය ... ... | 23,079 65 | | |
| රජයේ ආධාර— | | | |
| නිවාස යෝජනා ක්‍රමය ... | 6,233 50 | | |
| වලච්චත්ත පාර ... | 701 92 | | |
| කෙටේතැන්න මොරතොට පාර | 4,718 56 | | |
| කෙටේතැන්න පැතිකානු බැඳීම | 480 26 | | |
| ප්‍රජාමණ්ඩල ... ... | 200 0 | | |
| | | | 39,260 67 |
| ණය මුදල් ... ... | | | 6,530 46 |
| ක්ෂය සංචිතය ... | | | 1,000 0 |
| විවිධ ණය හිමියෝ ... | | | 24,273 87 |
| අධිකතා හා ඌනතා ගිණුම (සාමාන්‍ය) 1971.1.1 දිනට අධිකය ... | | 48,432 72 | |
| බැර (සකස් කිරීම්) ... | | 2,161 97 | 50,594 69 |
| 1971.12.31 දක්වා ආදායම ... | 76,362 53 | | |
| 1971.12.31 දක්වා වියදම ... | 69,397 72 | | |
| | | 6,964 81 | |
| | | | 57,559 50 |
| | | | 1,28,624 50 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| හිඟ ආදායම්— | | | |
| දේපල බදු ... ... | 15,935 96 | | |
| වසුරු බදු ... ... | 4,274 67 | | |
| වරෙන්තු ගාස්තු ... | 1,484 57 | | |
| කුලී ... ... | 89 0 | | |
| වැසිකිලි ගාස්තු ... | 55 0 | | |
| විදුලි ගාස්තු ... ... | 4,327 29 | | |
| | | | 26,166 49 |
| අත්තිකාරම් ... ... | | | 6,138 30 |
| විවිධ ණය ගැතියෝ ... | | | 37,149 98 |
| ස්ථිර තැන්පත් ... | | | 15,000 0 |
| 71.12.31 දිනට මුදල් ඉතිරිය ... | | | 34,983 11 |
| අධිකතා හා ඌනතා ගිණුම (විදුලිය) | | | |
| 1971.1.1 දිනට ඌණතාවය ... | | 11,159 87 | |
| 1971.12.31 දක්වා ආදායම ... | 55,206 94 | | |
| 1971.12.31 දක්වා වියදම ... | 53,233 69 | | |
| | | 1,973 25 | |
| | | | 9,186 62 |
| | | | 1,28,624 50 |

පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති හාරිස් ලිවචිඩීන් මරික්කාර් වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 දිනට පැල්මඩුල්ල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

කේ. ඩී. දවිත් අප්පුහාමි,
අංක 1 කොට්ඨාශයේ නගර සභික.

1972 ජූනි මස 27 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩී. ඊ. මලවර ආරච්චි,
සාම විනිසුරු.

### 1971 වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය

**ආදායම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ... ... ... | 60,021 35 |
| බී.—මංමාවත් ... ... ... | 1,636 09 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 882 38 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 8,970 06 |
| ඊ.—මහජන විනෝදය ... ... | 4,843 15 |
| ජී.—සුනඛ ලියාපදිංචිය ... ... | 9 50 |
| | 76,362 53 |
| වෙනත් ලැබීම්— | |
| තැන්පත් ... ... ... | 41,433 70 |
| අත්තිකාරම් ... ... ... | 10,846 77 |
| ණය මුදල් ... ... ... | 58,900 0 |
| විදුලිය ගිණුම ... ... ... | 55,206 94 |
| අධිකතා හා ඌනතා ගිණුම ... ... | 2,161 97 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 7,896 40 |
| ආදායම් එකතු කිරීමේ ගිණුම— | |
| දේපල බදු ... ... ... | 14,226 64 |
| වසුරු බදු ... ... ... | 4,488 88 |
| කුලී ... ... ... | 3,222 68 |
| වැසිකිලි ගාස්තු ... ... ... | 117 50 |
| වරෙන්තු ගාස්තු ... ... ... | 706 21 |
| විදුලි ගාස්තු ... ... ... | 22,231 37 |
| ක්ෂය සංචිතය ... ... ... | 500 0 |
| 1970 දෙසැම්බර් 31 දිනට ඉතිරි මුදල් ... | 31,177 79 |
| මුළු එකතුව ... | 3,53,753 25 |

**වියදම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ... ... ... | 27,952 37 |
| බී.—මංමාවත් ... ... ... | 10,846 14 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 4,338 13 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 25,743 88 |
| ඊ.—මහජන විනෝදය ... ... ... | 482 0 |
| එෆ්.—සුසාන භූමි ... ... ... | 35 20 |
| | 69,397 72 |
| වෙනත් ගෙවීම්— | |
| තැන්පත් ... ... ... | 29,247 03 |
| අත්තිකාරම් ... ... ... | 12,980 80 |
| ණය මුදල් ... ... ... | 54,873 90 |
| විදුලිය ගිණුම ... ... ... | 53,233 69 |
| විවිධ ණය ගැතියෝ ... ... ... | 34,344 78 |
| විවිධ ණය හිමියෝ ... ... ... | 16,841 15 |
| ආදායම් එකතු කිරීමේ ගිණුම— | |
| දේපල බදු ... ... ... | 15,137 07 |
| වසුරු බදු ... ... ... | 4,597 81 |
| කුලී ... ... ... | 3,286 18 |
| වැසිකිලි ගාස්තු ... ... ... | 172 50 |
| වරෙන්තු ගාස්තු ... ... ... | 725 01 |
| විදුලි ගාස්තු ... ... ... | 23,932 50 |
| 1971 දෙසැම්බර 31 දිනට ඉතිරි මුදල් ... ... | 34,983 11 |
| මුළු එකතුව ... | 3,53,753 25 |

පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති හාරිස් ලිවචිඩීන් මරික්කාර් වන මම ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1971 දෙසැම්බර් මස 31 දිනට පැල්මඩුල්ල සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ නිවැරදිවූත්, සත්‍යවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

කේ. ඩී. දවිත් අප්පුහාමි,
අංක 1 කොට්ඨාශයේ නගර සභික.

1972 ජූනි මස 27 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩී. ඊ. මලවර ආරච්චි,
සාම විනිසුරු.

02-77—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## අය - වැය ලේඛන

**විශේෂ කොමසාරිස් කාර්යාලය—අම්බලන්ගොඩ**

**1972—2 වැනි පරිපූරක වැය**

| වැය ශීර්ෂය | | | රු. | ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|---|---|---|
| ජී.—2. | (බී) | ගමන් ගාස්තු | 410 | 0 | 72.12.28 දින අංක 2 දරණ තීරණය |
| ජී.—2. | (ඇෆ්) | ලිපි ද්‍රව්‍ය, මුද්දර ආදිය | 2,000 | 0 | |
| ජී.—2. | (ඇල්) | අතිකාල දීමනා | 450 | 0 | |
| සී.—2. | | නඩත්තුව | 9,000 | 0 | |
| ඩී.—1. | | වැටුප් | 385 | 0 | |
| ඩී.—4. | | නඩත්තුව | 360 | 0 | |
| ඩී.—7. | | අළුත්වැඩ | 380 | 0 | |
| ඊ.—1. | (ඇෆ්) | උපකරණ හා බෙහෙත් | 10 | 0 | |
| ඊ.—1. | (ඇම්) | මාතෘ නිවාස හා දරකාභිවෘධි මධ්‍යස්ථානය | 10 | 0 | |
| ඊ.—2. | (ඒ) | වේතන | 2,340 | 0 | |
| ඊ.—2. | (බී) | කරත්ත, ගොනුන් හා ලොරි | 100 | 0 | |
| ඊ.—3. | (ඒ) | වේතන | 1,000 | 0 | |
| ඊ.—6. | (ඒ) | වැටුප් හා වේතන | 80 | 0 | |
| ජී.—1. | | වැටුප් හා වේතන | 580 | 0 | |
| ඇම්.—4. | | නඩත්තුව | 20 | 0 | |
| | | | 17,125 | 0 | |

කෝලිත වල්ගමගේ,
විශේෂ කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

1972 දෙසැම්බර් මස 28 වෙනි දින,
අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–734—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

**පොලොන්නරුව සුළු නගර සභාව**

**1972 වර්ෂයේ 2 වෙනි පරිපූරක වැය ලේඛණය**

**1 වෙනි කොටස—සාමාන්‍ය**

| වියදම් ශීර්ෂය | රු. | ශ. | යෝජනා අංකය හා සම්මත වූ දිනය |
|---|---|---|---|
| බී.—මංමාවත් :— | | | |
| (2) නඩත්තුව | 9,900 | 0 | 6 (ii) හා 72.11.30 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | | |
| (1) සාමාන්‍ය— | | | |
| (එච්) කාණු ඉදිකිරීම | 1,105 | 0 | එම |
| (3) වැසිකිළි ශෝධනය— | | | |
| (සී) උපකරණ | 1,400 | 0 | 9 (8) හා 72.11.30 |
| (5) ජල සම්පාදනය— | | | |
| (ඊ) ඉදිකිරීම | 1,750 | 0 | 6 (ii) හා 72.11.30 |
| එම | 4,000 | 0 | 7 (2) හා 72.12.4 |
| එකතුව | 18,155 | 0 | |

**2 වෙනි කොටස—විදුලි අංශය**

| වියදම් ශීර්ෂය | රු. | ශ. | යෝජනා අංකය හා සම්මත වූ දිනය |
|---|---|---|---|
| වි.දෙ. (1) විද්‍යුත්පාදනය— | | | |
| (ඩී) විදුලි බලය මිළදී ගැනීම | 21,304 | 0 | 6 (iii) හා 72.11.30 |
| වි.දෙ. (2) ප්‍රතිසංස්කරණය හා නඩත්තුව | | | |
| (ඒ) ගොඩනැගිලි | 3,536 | 0 | 6 (iii) හා 72.11.30 |
| එම | 1,700 | 0 | 7 (1) ඇ (1) හා 72.9.29 |
| වි.දෙ. (3) නිවෙස් වලට විදුලි බලය දීම— | | | |
| (ඒ) ද්‍රව්‍ය හා උපකරණ | 13,620 | 0 | 7 (1) (ආ) හා 72.9.29 |
| එම | 4,464 | 0 | 6 (iii) හා 72.11.30 |
| වි.දෙ. (4) පාලනය හා සාමාන්‍ය වියදම්— | | | |
| (ඩී) විවිධ වියදම් | 3,000 | 0 | 6 (iii) හා 72.11.30 |
| වි.දෙ. (6) වැඩි දියුණු කිරීම හා දීර්ඝ කිරීම | 20,000 | 0 | 7 (1) (අ) හා 72.9.29 |
| එම | 10,000 | 0 | 6 (4) හා 72.10.31 |
| එම | 12,000 | 0 | 8 (1) (ඊ) හා 72.11.30 |
| එකතුව | 89,624 | 0 | |

පු. ලි. බෞද්ධසාර,
සභාපති,
පොලොන්නරුව සුළු නගර සභාව.

1973 ජනවාරි මස 23 දින,
පොලොන්නරුව සුළු නගර සභා කාර්යාලයේ දී ය.

2–139/1—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## පොලොන්නරුව සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (2) යටතේ කෙරෙන අයදුම් පත්‍රය

### අය–වැය ලේඛනය 1972

1972 වර්ෂයේ අය-වැය ලේඛනයේ ඒ, ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන වැය ශීර්ෂයන් යටතේ වූ මුදල ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය වී තිබෙන වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1972 නොවැම්බර් මස 30 දින පවත්වන්නට යෙදුන සාමාන්‍ය මාසික සභා රැස්වීමේදී අංක 6 (1) දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

### I වෙනි කොටස—සාමාන්‍ය

| මුදල් ඉතිරි වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | | |
| (එෆ්) විශ්‍රාම වැටුප් … … … | 3 | 0 |
| (එච්) නිල ඇඳුම් … … … | 135 | 0 |
| (2) සංස්ථා වියදම්— | | |
| (ඒ) අතිරේක දීමනා … … | 235 | 0 |
| (සී) අයකැමි ගාස්තු … … … | 1,500 | 0 |
| (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු … … | 100 | 0 |
| (ඊ) නීති උපදේශක ගාස්තු … … | 500 | 0 |
| (ජී) රථවාහන හා ඔරු තහඩු … … | 3 | 0 |
| (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර … … | 150 | 0 |
| (ජේ) හදිසි වියදම් … … … | 200 | 0 |
| (එල්) වෛද්‍ය පහසුකම් … … | 50 | 0 |
| (3) ආපසු ගෙවීම් … … … | 10 | 0 |
| (5) දිළිඳු ශිෂ්‍යයන්ට පාසැල් පොත් ගැනීම … | 73 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වේතන හා දෛනික වැටුප්— | | |
| (සී) කම්කරුවෝ … … … | 3,642 | 0 |
| (3) යන්ත්‍ර හා ආයුධ … … … | 300 | 0 |
| (6) නිල තහඩු සහ අයකිරීමේ ලේඛණ … … | 400 | 0 |
| (12) නව කර්මාන්ත … … … | 50 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (1) වැටුප් … … … | 65 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඩී) නිල ඇඳුම් … … … | 75 | 0 |
| (එෆ්) විෂ නාශක ද්‍රව්‍ය … … | 100 | 0 |
| (ජේ) සෞඛ්‍ය සතිය සඳහා වියදම් … … | 75 | 0 |
| (කේ) කිරි විග්‍රහ කිරීමේ ගාස්තු … … | 100 | 0 |
| (ඇන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන … | 1,000 | 0 |
| (3) වැසිකිළි ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් … … | 3,250 | 0 |
| (ඊ) වැසිකිළි නඩත්තුව … … | 525 | 0 |
| (ජී) ඉදිකිරීම් … … … | 1,148 | 0 |
| (6) රෝහල්— | | |
| (ඒ) වේතන … … … | 510 | 0 |
| (7) පොදු වෙළඳ පොළවල් හා ගාල්— | | |
| (බී) නඩත්තුව … … … | 462 | 0 |
| (ඊ) අයකැමි ගාස්තු … … … | 1,100 | 0 |
| ඊ.—මහජන විනෝදය :— | | |
| (1) දෛනික වැටුප් … … | 600 | 0 |
| එෆ්.—සුසාන භූමි :— | | |
| (2) නඩත්තුව … … … | 199 | 0 |
| ජී.—බල්ලන් ලියා පදිංචි කිරීම :— | | |
| (1) සුනඛ ඝාතනය … … … | 750 | 0 |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (3) පොත්පත් සහරා … … … | 1,700 | 0 |
| (4) දූව භාණ්ඩ … … … | 500 | 0 |
| (5) නඩත්තුව … … … | 1,000 | 0 |
| එකතුව … | 20,510 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| (1) නිලධාරීන්ගේ වැටුප්— | | |
| (බී) ලිපිකරුවෝ … … … | 387 | 0 |
| (සී) ආදායම් පරීක්ෂකයෝ … … | 421 | 0 |
| (ඩී) තක්සේරු කරන්නන්ගේ ගාස්තු … … | 162 | 0 |
| (2) සංස්ථා වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු … … … | 600 | 0 |
| (එෆ්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රකාශණ හා තැපැල් ගාස්තු මුද්දර… | 5,500 | 0 |
| (එම්) අතිකාල දීමනා … … | 600 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වේතන හා දෛනික වැටුප්— | | |
| (බී) පාලකවරු … … … | 105 | 0 |
| (4) වීථි ආලෝක කිරීම … … | 1,155 | 0 |
| සී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (4) නඩත්තු කිරීම— … … … | 2,000 | 0 |
| ඩී.—මහජන සෞඛ්‍යය :— | | |
| (2) කසළ ශෝධනය— | | |
| (ඒ) දෛනික වැටුප් … … | 2,791 | 0 |
| (බී) ගොන් කරත්ත හා ලොරි … … | 2,000 | 0 |
| (5) ජල සම්පාදනය— | | |
| (ඊ) ඉදිකිරීම් … … … | 4,639 | 0 |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (1) වේතන … … … | 150 | 0 |
| එකතුව … | 20,510 | 0 |

සු. ලි. බෞද්ධසාර,
සභාපති,
පොලොන්නරුව සුළු නගර සභාව.

1973 ක්වූ ජනවාරි මස 23 දින,
පොලොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදීය.

02–139/2—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973–1976)

විදුලිය යෝජනා

ප්‍රාදේශීය සහකාර ප.පා.කො. කොට්ඨාශය—ගාල්ල
මැතිවරණ කොට්ඨාශය : බලපිටිය
වතුගෙදර සුළු නගර සභාව
සභාවේ ශ්‍රේණිය—4

| | 1973 | | 1974 | | 1975 | | 1976 | | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | |
| (1) යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනයන්— | — | | — | | — | | — | | — |
| (ඒ) විදුලිය නිපදවීමේ යන්ත්‍ර ... | — | | — | | — | | — | | — |
| (බී) රථ වාහන ... ... | — | | — | | — | | — | | — |
| (සී) ආයුධ ... ... | 450 | 0 | 600 | 0 | 400 | 0 | 500 | 0 | — |
| (2) උප මධ්‍යස්ථාන දියුණු කිරීම ... | 1,400 | 0 | 7,000 | 0 | 3,500 | 0 | — | | — |
| (3) අළුත් උප මධ්‍යස්ථාන ... | — | | — | | 15,000 | 0 | — | | — |
| (4) විදුලිය බෙදහැරීමේ මාර්ග දියුණු කිරීම ... | 3,500 | 0 | 6,000 | 0 | 8,000 | 0 | 5,000 | 0 | — |
| (5) විදුලිය බෙදහැරීමේ මාර්ග දියුණු කිරීම ... | 105,000 | 0 | 9,000 | 0 | 7,000 | 0 | 5,000 | 0 | — |
| (6) ගොඩනැගිලි ... ... | — | | — | | — | | 15,000 | 0 | — |
| එකතුව ... | 110,350 | 0 | 22,600 | 0 | 33,900 | 0 | 25,500 | 0 | |

73.01.20

ඇල්. සී. ද සිල්වා,
වතුගෙදර සුළු නගර සභාවේ සභාපති.

02–143—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973–1976)

ඇමුනුම (ඩී)

විදුලිය යෝජනා

ප්‍රාදේශීය සහකාර ප.පා.කො. කොට්ඨාශය : කළුතර
මැතිවරණ කොට්ඨාශය : බේරුවල
පළාත් ආණ්ඩු සභාව : අළුත්ගම සුළු නගර සභාව
පළාත් ආණ්ඩු සභාවේ ශ්‍රෙණිය : III වැනි ශ්‍රෙණිය

| | 1973 | | 1974 | | 1975 | | 1976 | |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| (1) යන්ත්‍ර සහ උපකරණ සඳහා ආයෝජනයන් — | | | | | | | | |
| (ඒ) විදුලිය නිපදවීමේ යන්ත්‍ර ... | — | | — | | — | | — | |
| (බී) රථවාහන ... ... | — | | — | | — | | — | |
| (සී) ආයුධ ... ... | 500 | 0 | 1,500 | 0 | 200 | 0 | 200 | 0 |
| (2) උප මධ්‍යස්ථාන දියුණු කිරීම... ... | — | | 2,000 | 0 | 500 | 0 | 500 | 0 |
| (3) අළුත් උප මධ්‍යස්ථාන .... ... | 11,500 | 0 | — | | — | | — | |
| (4) විදුලිය බෙද හැරීමේ මාර්ග දියුණු කිරීම ... | — | | 500 | 0 | 500 | 0 | 500 | 0 |
| (5) බෙද හැරීමේ මාර්ග දීර්ඝ කිරීම, අළුත් ... | — | | — | | 5,000 | 0 | 2,000 | 0 |
| (6) ගොඩනැගිලි ... ... | — | | — | | — | | 2,000 | 0 |
| එකතුව ... | 12,000 | 0 | 4,000 | 0 | 6,200 | 0 | 5,200 | 0 |

ලයනල් පෙම්මාවඩු,
ලේකම්,
අළුත්ගම සුළු නගර සභාව.

ජී. ඇල්. ටී. ද සිල්වා,
සභාපති,
අළුත්ගම සුළු නගර සභාව.

1973.1.23 දින,
අළුත්ගම සුළු නගර සභා කාර්‍ය්‍යාලයේ දීය.

02–148—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය සුලු නගර සභාව

1972 අය වැය ලේඛන්‍ය

සුළු නගර සභා මු. රෙ. 40 (ii) යටතේ කෙරෙන අයදුම් පත්‍රයයි

1972 අය වැය ලේඛනයෙන් ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේ යයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ වලට මාරුකර අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1972 දෙසැම්බර් මස 28 වෙනි දින පවත්වනලද පුන්ඩලුඔය සුලු නගර සභාවේ මාසික සභා රැස්වීමේ අංක 3/1 දරන යෝජනාවෙන් සභා සම්මත විය.

I වෙනි කොටස—සාමාන්‍ය අංශය

මුදල් ඉතිරිවන වැය ශීර්ෂ

| | | රු. | ශ. |
|---|---|---|---|
| සී.—4. | නඩත්තු කිරීම ... ... ... | 1,170 | 0 |
| ජ්.—2. | (අයි) නිවාඩු දුම්රිය බලපත්‍ර ... ... | 380 | 0 |
| සී.—1. | (එන්) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 500 | 0 |
| ඩී.—1. | (එෆ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... | 125 | 0 |
| බී.—2. | නඩත්තු කිරීම ... ... ... | 400 | 0 |
| ඩී.—2. | (ඒ) කශල ශෝධන—වේතන ... ... | 400 | 0 |
| ඩී.—3. | (ඊ) වැසිකිලි නඩත්තු ... ... | 50 | 0 |
| ඩී.—2. | (ඒ) කශල ශෝධන—වේතන ... ... | 1,500 | 0 |
| ඩී.—1. | (ජේ) සෞඛ්‍ය සතිය ... ... | 50 | 0 |
| ඊ.—2. | මහජන විනෝද ... ... ... | 200 | 0 |
| ඒ.—2. | (ඊ) නීතිඥ ගාස්තු ... ... | 125 | 0 |
| | එකතුව ... | 4,900 | 0 |

මුදල් අවශ්‍යවන වැය ශීර්ෂ

| | | රු. | ශ. |
|---|---|---|---|
| ජේ.—7. | ඉදිකිරීම ... ... ... | 1,550 | 0 |
| බී.—12. | අලුත් වැඩ ... ... ... | 500 | 0 |
| ඩී.—5. | (සී) නඩත්තු කිරීම ... ... | 125 | 0 |
| ඒ.—2. | (එෆ්) ලිපිද්‍රව්‍ය ... ... | 400 | 0 |
| ඒ.—4. | ආධාර හා දීමනා ... ... | 450 | 0 |
| බී.—4. | වීදි ආලෝක කිරීම ... ... | 1,500 | 0 |
| සී.—1. | වේතන ... ... ... | 50 | 0 |
| ඩී.—5. | (බී) උපකරණ ... ... | 200 | 0 |
| ඊ.—7. | විනෝද බදු පරීක්ෂාව ... ... | 125 | 0 |
| | එකතුව ... | 4,900 | 0 |

2 වෙනි කොටස—විදුලි අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| 4.—සී. මුද්‍රණය ... ... ... | 200 0 | ඊ.—6. දීර්ඝ කිරීම ... ... ... | 200 0 |
| 2.—සී. ප්‍රතිසංස්කරණය ... ... ... | 900 0 | 1.—ඩී. විදුලි බලය මිලයට ගැනීම ... ... | 2,500 0 |
| 4.—ඩී. අනියම් වියදම් ... ... ... | 1,300 0 | | |
| 3.—ඒ. නිවාසයනට කම්බි ඇදීම ... ... | 300 0 | | |
| | 2,700 0 | | 2,700 0 |

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්චිලුඹය සුලු නගර සභාව.

සුලු නගර සභා කාර්යාලය,
පුන්චලුඹය, 72.12.28.

අනුමත කරමි.

ඇල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
නුවරඑළිය.

පළාත් පාලන කාර්යාලය,
නුවරඑළිය, 73.01.05.

2-168—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

ඇමුණුම (ඩී)

මතුගම සුළු නගර සභාව

සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම (1973–1976)

විදුලි යෝජනා ක්‍රම

ප්‍රාදේශීය සහකාර ප.පා.කො. කොට්ඨාශය : කළුතර
මැතිවරණ කොට්ඨාශය : මතුගම
පළාත් ආණ්ඩු සභාව : මතුගම සුළු නගර සභාව
පළාත් ආණ්ඩු සභාවේ ශ්‍රේණිය : තුන්වන ශ්‍රේණිය

| | 1973 රු. ශ. | 1974 රු. ශ. | 1975 රු. ශ. | 1976 රු. ශ. |
|---|---|---|---|---|
මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් 1973 වර්ෂයේදී මස් කඩයක් පවත්වාගෙන යෑමට බලපත්‍රයක් ඉල්ලුම්කර සිටින බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන වාද්දුව සුළු නගර සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, එම මස් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ජේ. ඇම්. ඇම්. රියාල්, ඔරුවැල්ල පාර, පානදුර | එල හරක් මස් | වාද්දුව පොදු වෙළඳ පොල, ගවමස් කඩය |

ඇම්. ඩී. ජේ. ගුණතිලක,
සභාපති,
සු.න.ස. වාද්දුව.

1972.12.30 දින,
වාද්දුව සුළු නගර සභා කාර්යාලයේ දීය.

2–360—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහනාන්නේරිය ගම්සභාව

### (272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1973 වර්ෂයට බල පත්‍රයක් ඉල්ලා තිබෙන බවත්, ඒ අනුව බල පත්‍ර නිකුත් කිරීම ගැන මහනාන්නේරිය ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතුව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, (272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ අංක 7 දරණ වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම හා වෙළඳාම් කරන ස්ථානය |
|---|---|
| 1. ඇම්. අබ්දුල් කාදර් සහ ඇස්. ඒ. ඇම්. හනීපා මයා, තබුත්ත, ගල්ගමුව. | යාය 3 ප්‍රධාන ඇලදිගේ තඹ මිටගම 6 වැනි සැතපුම් කණුව අසල. |

ඇන්. අබුසාලි,
සභාපති,
මහනාන්නේරිය ගම්සභාව

1973. 01. 02 දින,
ගම්සභා කාර්යාලය,
වන් නිකුඹාවැව.

2–586—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

**මහනුවර දිස්ත්‍රික්කයේ පා. දු. පැලිස්පත්තුව බටහිර ගම්සභාව**

මස් මරන්නන් පිළිබඳ ආඥාපනත

ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරය) 13අ (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නිසි බලධරයා වූද, පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභාවේ සභාපතිතැන වූද, ඇම්. ජේ. බී. ඒකනායක වන මම 1973 වර්ෂය තුලදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන කාල සීමාව ඇතුලත හා ප්‍රදේශයන්හි මස් පිණිස සතුන් මැරීම හෝ මස් විකිණීම පිණිස ප්‍රදර්ශණය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

ඇම්. ජේ. බී. ඒකනායක,
නිසි බලධරයා,
පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභාවේ
සභාපති.

1973 ජනවාරි මස 04 වැනි දින,
පා. දු. පලිස්පත්තුව බටහිර ගම්සභා කායාීලයේදී ය.
දිගන, කෙන් ගල්ල.

උපලේඛනය

| ප්‍රදේශය | කාලය |
|---|---|
| ගෝනවල ග්‍රාම සේවක කොට්ඨාශය තුළ පිහිටි, දිගන, ගෝනවල, ගංකෙමල යන ගම් ප්‍රදේශය | 1973 ජනවාරි 16 දින සිට 1973 දෙසැම්බර් මස 31 දක්වා |

2-590—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබොඩ පේරුව ගම්සභාව**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දැක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 අධිකාරයේ 7 (2) වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන ඔයබොඩ පේරුව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙකු වේ නම්, තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ 7 (2) බී වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාම |
|---|---|
| 1. ඇම්. ඇස්. ඇම්. ෂරීජ්, තිහාරිය, කලගෙඩිහේන | තිහාරිය ගොබැල්ලේ හරක් මස් කඩය. |
| 2. ඇස්. ඇම්. රෂීඩ්, තිහාරිය, කලගෙඩිහේන | තිහාරිය නුවර පාරේ හරක් මස් කඩය |

ඩී. ඊ. විජයසුන්දර,
ඔයබොඩ පේරුව ගම්සභාවේ සභාපති.

ඔයබොඩ පේරුව ගම්සභාව,
කලොටුවාව, කලගෙඩිහේන,
1973. 01. 05.

2-634—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**උතුරු උලගල්ල කෝරළේ ගම්සභාව**

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1973 වර්ෂයේ මස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම් පතක් මාවෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වන පරිච්ඡේදයේ) 7(2) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන උතුරු උලගල්ල කෝරළේ ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම්, ඒ කුමන කරුණු මතදැයි දක්වෙන අනු පිටපතකින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ දැන්වීම පලවූ දින සිට දහතතර (14) දවසක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. රසීදු, නාච්චාදූව, හිදෝගම ... | හරක් මස් වෙළඳාම ... | නාච්චාදූව |

යූ. බී. ඉලංගසිංහ,
උතුරු උලගල්ල කෝරළේ ගම් සභාපති.

1973 ජනවාරි මස 10 දින,
තිරප්පනේ,
ගම්සභා කාර්යාලයේ දීය.

2—932—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**නුවරඑළිය දිස්ත්‍රික්කය—නානුඔය ගම්සභාව**

මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අයවළුන් විසින් එහි දක්වෙන ස්ථානවල 1973 වර්ෂය තුළ මස්කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන නුවරඑළිය දිස්ත්‍රික්කයේ නානුඔය ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ හෝ සංවිධානයක විරුද්ධතාවයක් ඇත්නම් එය විස්තර සහිත ලිපියකින් පිටපත් දෙකක් සිටිනසේ සකස් කොට මෙම දැන්වීම ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මාවෙත එවීමට අවසර ඇති බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඔමර්දීන් හනීපා, 90, ස්ටේෂන් වටගොඩ | හරක් මස්... වෙළඳම | අංක 61, නානුඔය නගරය |
| 2. ඊ. ජියාද්, ඇලතොප්කොටේජ් නුවරඑළිය | එම ... | නානුඔය තැපැල් කාර්යාලය අසල තාවකාලික ගොඩනැගිල්ල |
| 3. ඇස්.ඇම්. ෂරීජ්, 90, ස්ටේෂන් වටගොඩ | එළු මස් ... වෙළඳාම | අංක 60/1, නානුඔය |

ඇන්. ඇස්. පී. සෝමපාල,
නානුඔය ගම්සභාවේ සභාපති.

1973 ජනවාරි මස 04 වැනි දින,
නානුඔය ගම්සභා කායාීලයේදීය.

2-615—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**කුරුවිට කෝරළේ මැද පත්තු ගම් සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් අයවලුන් විසින් 1973 වර්ෂය තුළදී මස් පිණිස සතුන් මැරීමට හා මස් විකිණීමට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන විරුද්ධ වන කුරුවිට කෝරළේ මැද පත්තු ගම් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ඕනෑම අයෙකු වේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින දහහතරක් (14) ඇතුළත තමාගේ විරුද්ධතාවයන්ට හේතු සඳහන් කරන ලද ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මාවෙතලියා පදිංචි කරන ලද තැපෑලෙන් ඉදිරිපත් කරන ලෙස ගෝඝාතක ආඥාපනතේ (272 වන අධිකාරය) 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| ඇස්. ඇම්. ඇම්. මුසම්මිර්, අටුලුගම, බණ්ඩාරගම | මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම (එළ හරක් සහ එලු මස්) | කිරිඇල්ල පොදු වෙළඳ පොලේ අංක 7 දරණ කඩ කාමරය |

එස්. එස්. ධනවර්ධන,
සභාපති,
කුරුවිටි කෝරළේ මැද පත්තු ගම් සභාව.

ගම්සභා කාර්යාලය,
කිරිඇල්ල,
1973 ජනවාරි මස 11 වැනි දින.

2-911—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත් එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට අලුත් නුවර ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, අලුත් නුවර ගම්සභාවේ සභාපති පී. ආර්. රත්නායක වන මම තීරණය කරමි.

පී. ආර්. රත්නායක,
සභාපති අලුත් නුවර ගම්සභාව.

1973 ජනවාරි 26 වැනි දින,
අලුත් නුවර ගම්සභා කාර්යාලය,
ඇල් පිටිය-පරණගම.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10;517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යලස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්.

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද,

(2) එම කොටසේ අවසානයට පහත දැක්වෙන ලේඛනය අන්තර් ගත කිරීමෙන් :

උපලේඛනය

I වැනි කොටස

අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කලුගල් කැණීම,
කබුක්, බොරළු හෝ කලුගල් ගබඩා කිරීම,
සිසිල් බීම නිෂ්පාදනය,
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම ගබඩා කොට තබා ගැනීම,
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කොට තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවලු තෙල් නිශ්කර්ෂණය.
පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීත්තු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
හිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා, පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.
අලුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි විවීම හා විසිතුරු කිරීම
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

II වැනි කොටස

අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පොර හෝ රසායන පොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩා කර තබා ගැනීම:
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුලන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤොක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එසින් කළ භාණ්ඩ ගබඩා කර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
හුනුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.

පැනි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

ඉන්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබා ගැනීම.

ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.

කෝඩා නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.

සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.

පලතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.

කෝපි, ධාන්‍ය වර්ග, මාෂබෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.

යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.

බේකිං පවුඩර් නිපදවීම.

මාජරින් නිපදවීම.

ගෑස් මැන්ටල් නිපදවීම.

පොට් නිපදවීම.

ඉටිපන්දම් නිපදවීම.

කපුරු නිපදවීම.

ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.

රෙදි සෝදන නිල් නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

සායම් කුඩු නිපදවීම.

ලාකඩ නිපදවීම.

සුවඳ පුයර නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

පාසල් රටහුනු නිපදවීම.

වයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.

සීත කළ මස් හෝ මාළු ගබඩා කර තැබීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දියහුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරියල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේළීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චිකොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කවා (කොයිල්ස්) නිපදවීම.

ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක, හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම.

සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩපලක් පවත්වාගෙන යෑම.

2–885—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## ආනවිලුන්දන් පත්තු ගම් සභාව

### ගෝඝාතක ආඥාපනත (272 වන අධිකාරය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි නම සඳහන් අය විසින්, ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් කර ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා, මස් විකිණීම, සඳහා බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යට තේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍රය 1973 වර්ෂය සඳහා නිකුත් කිරීම ගැන ආනවිලුන්දන් පත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දහහතරක් ඇතුළත දී මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. අබ්දුල් කාදර්, බත්තුළුඔය ... | ... ගව මස් ... | ... බත්තුළුඔය, උඩප්පු හන්දියේ පිහිටි මස් වෙළඳ හල |

එම්. ඩී. යාපා,<br>සභාපති,<br>ආනාමිලුන්දන් පත්තු ගම්සභාව.

1973 ජනවාරි 1 වැනි දින,<br>ගම්සභා කාර්යාලයය,<br>ආරච්චිකට්ටුව, රාජකදළුව.

2–605—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

## මෙගොඩපොත ගම්සභාව (කොළඹ දිස්ත්‍රික්කය)

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි නම සඳහන් අය විසින් එහි සඳහන් කොට ඇති ස්ථානයෙහි 1973 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන මෙගොඩපොත ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට දින 14 ක් (දහතරක්) ඇතුළතදී මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|---|
| ඇම්. ඇල්. ඇම්. ජුනයිදීන් ... | ... මුස්ලිම් හෝටලය, ඌරපොල ... | ... එළ හරක් මස් | ... කහටඹිවිට |

ආර්. ඇම්. ඇස්. ඇස්. රාජකරුණා,
මෙගොඩපොත ගම්සභාපතිතැන.

1973 ජනවාරි මස 1 වැනි දින,
මෙගොඩපොත ගම්සභා කාර්යාලය,
ඌරාපොල.

2-602—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## කළුතර නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අයවලුන් විසින් එහි සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරයේ) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන කළුතර නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වනුයේ කුමන හේතූන් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙනු ලැබේ.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
බලයලත් නිලධාරී.
කළුතර නගර සභාව.

1973 ජනවාරි මස 1 වැනි දින,
කළුතර, නගරසභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාමේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ආර්. එම්. තාහිර් ... | ... එළ හරක් මස් ... | ... දකුණු කළුතර වෙළඳ පොලේ අංක 5 දරණ ස්ථානය |
| 2. ඒ. ආර්. එම්. තාහිර් ... | ... මී හරක් මස් ... | ... දකුණු කළුතර වෙළඳ පොලේ, අංක 6 දරණ ස්ථානය |
| 3. ඒ. ආර්. එම්. තාහිර් ... | ... එළ හරක් මස් සහ මී හරක් මස් | ... උතුරු කළුතර, ගාලු පාරේ අංක 269 දරණ ස්ථානය |

2-600—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගහ ඉහල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 (2) වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩපළාත ගහඉහළ ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බවට මෙයින් දනුම් දෙමි.

ඇම්. ඇස්. අලුත්ගමගේ,
සභාපති.
ගහඉහළ ගම්සභාව.

1973 ජනවාරි මස 3 වැනි දින,
උඩපළාත ගහඉහළ ගම්සභා කාර්යාලය,
ගල්පාය, මීතලාව.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇස්. ඇම්. නිෂාම්, අංක 215, උලපනේ ... | ... හරක් මස් කඩය ... ... | ... අංක 215, උලපනේ |

2-599—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## කම්මල් පත්තු ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානවල 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා අයදුම්පත්‍ර මා වෙත ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නවුන් පිළිබඳ ආඥාපනතේ 272 වන පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කම්මල් පත්තු ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාමේ ස්වභාවය |
|---|---|
| 1. (අ) කේ. ඉසබෙල් ප්‍රනාන්දු, බ/දුම්මලදෙනිය, වෙන්නප්පුව. | කොස් ගස් හන්දියේ සිට නයිනමඩම-කොළින්ජාඩිය, ප්‍ර. වැ. දෙ. පාර දක්වා මැද භාග යේ දකුණුපැත්තට, එළහරක් මස්, එළු මස් හා ඌරු මස් |

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය සහ වෙළඳාමේ ස්වභාවය |
|---|---|
| 3. එච්. සුසිලා පෙරේරා, නො. 67, ගලයාය, බ/නයිනමඩම, වෙන්නප්පුව. | බ/නයිනමඩම ඡන්ද කොට්ඨාශය තුළ එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 4. පී. ග්‍රෙගරි ඇල්ප්‍රඩ් ප්‍රනාන්දු, ඒදන්ඩ පාර, වෙන්නප්පුව. | නැ/නයිනමඩම දිස්පැන් සරිය හන්දියේ සිට පරණ ලමා රක්ෂක මධ්‍යස්ථානය දක්වා එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 6. ජේ. කේ. ඇන්ටනි පෙරේරා, වයික්කාල. | ගිං ඔය පාලම ලඟ සිට බෝල වත්ත හන්දිය දක්වා, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 7. ඩබ්. ක්‍රිස්ටෝපර් ස්ටැන්ලි ප්‍රනාන්දු, කැප්ටන් බේකරිය, වයික්කාල. | නන්ජුන්ඩන්කරය හන්දියේ සිට සැ. 1/4 ක් ඇතුළත ප්‍රදේශයේ, එළුහරක් මස, එළු මස් සහ ඌරු මස්. |
| 8. ජේ. කේ. මැවිලස් පෙරේරා, ඔතර තඹරවිල, දන්කොටුව. | කම්මල හන්දියේ සිට සැ. 1/4 ක් ඇතුළත (බෝල වත්ත පාර) එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 9. ඩබ්. කෙලමෙන්තු ප්‍රනාන්දු, "සිසිර", වයික්කාල. | වයික්කාල හන්දියේ සිට කම්මල හන්දිය දක්වා, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 10. ඩබ්. සිමියොන් ප්‍රනාන්දු, "සිසිර", වයික්කාල. | වයික්කාල හන්දියේ සිට සැ. 1/4 ක් ඇතුළත ප්‍රදේශයේ එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 11. ඩබ්. සිමියොන් වාස්, "සිසිර", වයික්කාල | වයික්කාල ගම් සභා ළිඳ ලඟ සිට යාර 200 ක් ඇතුළත එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 13. ආර්. එඩ්මන්ඩ් ප්‍රනාන්දු, තඹරවිල, වයික්කාල | තඹරවිල (තෝප්පුව) හන්දියේ අරක්කු තැබෑරුම ලඟ සිට ගොඩැල්ලට හැරෙන පාර දක්වා, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 14. ඇස්. සිමියොන් ප්‍රනාන්දු, වයික්කාල. | බොරලැස්ස ප්‍ර. වැ. දෙ. පාරේ බටහිර පැත්තට එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 15. ඩබ්. ගිරිගෝරිස් ප්‍රනාන්දු, මීරිස්සන්කොටුව, ලුණුවිල. | මීරිස්සන්කොටුව ඡන්ද කොට්ඨාශය තුළ, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 16. කේ. ජෝශප් පෙරේරා, උල්හිටියාව, වෙන්නප්පුව. | උල්හිටියාව සුළු නගර සභා ප්‍රදේශයෙන් පිට, එළුහරක් මස් එළු මස් සහ ඌරු මස්. |
| 17 (අ) ඩබ්. ඇම්. ඇන්ටනි, කැනිෂියුස් පීරිස්, උල්හිටියාව, වෙන්නප්පුව. | වෙන්නප්පුව සුළු නගර සභා සීමාවෙන් පිට ගොරකගස් හන්දිය දක්වා, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 18. එච්. ඇනී මාග්‍රට් පෙරේරා, රා තැබෑරුම පිටුපස, වෙන්නප්පුව. | කොළිඤ්ජාඩිය ඡන්ද කොට්ඨාශය තුළ, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 19. ඇස්. සී කැනිෂියුස් අප්පුහාමි දෙමටපිටිය පාර, කටුනේරිය | බ/කටුනේරිය ගල් මල් පඳුර පාරේ සිට බැන්කඩ හන්දිය දක්වා (තැබෑරුම ලඟ) එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 20. ඇම්. සී. ප්‍රැන්සිස් අප්පුහාමි, මයිලාව, තබ්බෝව, නාත්තන්ඩිය. | බ/කටුනේරිය ගල් මල් පඳුර පාරේ සිට බැන්කඩ හන්දිය දක්වා (චිත්‍රකලය ලඟ), එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 21. ඩබ්. ජූලියන් තමෙල්, බුළු ගහ පාර, කටුනේරිය. | බ/කටුනේරිය ගල් මල් පඳුර පාරේ සිට බැන්කඩ හන්දිය දක්වා (තැබෑරුම ලඟ) එළුහරක් මස්, එළු මස්, සහ ඌරු මස් |
| 22. ඩබ්. පොරලෙන්තිනා ප්‍රනාන්දු, කොළිඤ්ජාඩිය, වෙන්නප්පුව. | නැ/කටුනේරිය ආදම් හන්දියේ සිට බැන්කඩ හන්දිය දක්වා (ජුඩ් පාර දක්වා) මාළු කඩේ ලඟ, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 23. ඩබ්. ජේරාඩ් තමෙල්, මැද කටුනේරිය, කටුනේරිය. | නැ/කටුනේරිය පරණ පාන් කඩේ පාරේ ගමමැද කොට්ඨාශය, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 24. බී. මේරි මාග්‍රට් පෙරේරා, නො. 67, ගලයාය, බ/නයිනමඩම, වෙන්නප්පුව. | බ/නයිනමඩමේ මුට්ටුව හන්දියේ සිට සැ. 1/4 ක් ඇතුළත ප්‍රදේශයේ, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 25. පී. ඩබ්. චන්ද්‍රරත්න, ඒදන්ඩ පාර, වෙන්නප්පුව. | වෙන්නප්පුව කොළණිය, එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස්. |
| 26. ඩබ්. ජෝන් ප්‍රනාන්දු, කොළිඤ්ජාඩිය, වෙන්නප්පුව. | දෙමටපිටිය හන්දියේ සිට කන්නඩි හන්දිය දක්වා, එළුහරක් මස්, එළු මස්, සහ ඌරුමස්. |

පී. ඇම්. ඩී. ජී. ඩබ්. පීරිස්,
සභාපති,
කම්මල් පත්තු ගම් සභාව.

නයිනමඩම, වෙන්නප්පුව,
1973 ජනවාරි මස 8 වැනි දිය දීය.

2–746—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර ඉල්වා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත කඳුකර ඉහල ගම් ප්‍රදේශයේ ගම්සභා සීමාව තුල යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන කරුන නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඩී. ඇම්. කුවන්, පුපුරැස්ස ... ... ... | හරක්මස් විකිණීම ... | පුපුරැස්ස |
| 2. ඩී. ඇම්. කුවන්, පුපුරැස්ස ... ... ... | එළුමස් විකිණීම ... | පුපුරැස්ස |

ඩබ්ලිව්. ඇස්. රාජපක්ෂ
සභාපති
උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව.

1973.1.6
අටබාගේ.

2–608—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## හොරොම්බාව ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයන් 1973 වර්ෂය තුළ මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, ඒ අනුව එකී බලපත්‍රය නිකුත්කිරීම ගැන හොරොම්බාව ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කොට පිටපත් දෙකකින් යුක් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උප ලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|---|
| 1. | ඩබ්ලිව්. මයිකල් ප්‍රනාන්දු, මස්කඩය, කටුපොත ... | හරක්මස් ... | පොල්පිටිය සිල්වලාගේ වත්තේ පිහිටි කඩ කාමරය |
| 2. | ඇන්. ඇල්. ඒ. වාහිඩ්, කහටගහමඩ, පහමුනේ ... | එම ... | සියඹලගස්කොටුව දංගහමුල වත්තේ පිහිටි කඩකාමරය |
| 3. | ඇන්. ඇල්. ඒ. වාහිඩ්, කහටගහ මඩ, පහමුනේ ... | එම ... | පොල්පිටිය සිල්වලාගේ වත්තේ අංක 38 දරණ කඩකාමරය |
| 4. | ඒ. ඇල්. මොහම්මදු සරිබු, ගාල්ලෙ ගම, අලහිටියාව ... | එම ... | කැකුණගොල්ල කහටගහමුල වත්තේ කඩකාමරය |
| 5. | එස්. එල්. එම්. ජබීර්, අබහේන් වැව. පහමුනේ ... | එම ... | හොරොම්බාව මුස්ලිම් පල්ලිය වත්තේ කඩකාමරය |
| 6. | එන්. එල්. එම්. සෙයිනුදීන්, අබහේන්වැව, පහමුනේ ... | එම ... | පොල්පිටිය කඳුළුවහේන නොහොත් වත්තේ කඩකාමරය |
| 7. | අයි. එල්. ජුනයිදීන්, කැකුණගොල්ල, පල්ලියපාර. කටුපොත ... | එම ... | කැකුණගොල්ල කහටගහමුල වත්තේ කඩකාමරය |
| 8. | ඒ. ඇල්. මොහම්මදු සරිබු, ගාල්ලෙ ගම, අලහිටියාව ... | එම ... | පොකුහැර තල්වැව ලඟ කුඹුරේ බිම් කැබැල්ලේ කඩකාමරය |
| 9. | පී. ටී. අබුබක්කර්, මඩිගෙ මිදියාල, බණ්ඩාරකොස්වත්ත ... | එම ... | පොල්පිටිය කඳුගමුව හේන නොහොත් දනාට වත්තේ කඩකාමරය |
| 10. | ඒ. ඉබ්‍රාහිම් නොහොත් සම්සුදීන්, පරගහකොටුව, පහමුනේ ... | එම ... | සියඹලගස් කොටුව දන්ගහමුල වත්තේ කඩකාමරය |
| 11. | ඒ. මුහම්මදු මර්සූන්, පරගහකොටුව, පහමුනේ ... | එම | පොල්පිටිය මරක්කයාගේ හේන නොහොත් ඉඩමේ අංක 56 දරණ කඩකාමරය |

ඇස්. ප්‍රේමරත්න,
හොරොම්බාව ගම්සභාවේ සභාපති.

1973 ජනවාරි මස 5, වැනි දින
කටුපොත, ගොඩවෙල ගම්සභා කාර්යාලයේදීය.

2–616—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## මාදම්පේ සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ අයගේ නම් ඉදිරියේ සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ(272 වන අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන මාදම්පේ සුළු නගරසභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විසින් එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණු මත යයි දක්වෙන ලියවිල්ලක්, පිටපත් දෙකකින් යුතුව, මේ දැන්වීම පලවී දින 14 ක් යාමට මත්තෙන් මා වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | වෙළඳාම කරන ස්ථානය |
|---|---|---|---|
| 1. | ඩබ්ලිව්. නෝබට් ප්‍රනාන්දු, බිංගිරිය ... ... | ගව මස්, එළුමස් ... | නව නගරය |
| 2. | ඇම්. නිලව්දීන්, පැරණි නගරය, මාදම්පේ ... ... | ගව මස්, එළු මස් ... | පැරණි නගරය |

සේගුපති සේගු ඊබ්‍රාහිම්,
සභාපති,
සුළු නගරසභාව, මාදම්පේ.

1973 ජනවාරි මස 2 වැනිද,
මාදම්පෘ සුළු නහර සභා කාර්යාලය,
මාදම්පේ.

2–646—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

---

## තෝලංගමුව ගම්සභා ප්‍රදේශය

### මස් පිණිස සතුන් මැරීමේ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයෙහි 1973 වර්ෂය තුළ මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, මෙම ඉල්ලුම්පත්‍රය නිකුත් කිරීම ගැන කෑගල්ල දිස්ත්‍රික්කයේ තෝලංගමුව ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට දින 14ක් (දහ හතරක්) ඇතුළතදී මාවෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 අධිකාරය) 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. ජී. කීර්තිරත්න,
පාලන නිලධාරි, තෝලංගමුව ගම්සභාව.

1972 දෙසැම්බර් මස 29 වැනි දින,
තෝලංගමුව ගම්සභා කාර්යාලයේදීය,
මායින්නොළුව, දොරවක.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඒ. ඒ. සමඩ්, 11/1, මස්ජිඩ් මාවත, වරකාපොල ... | හරක්මස් ... | වරකාපොල මුස්ලිම් ගොඩැල්ලේ කොස්වත්ත නැමැති ඉඩමේ |

2–650—73.02.02 දින අංක 45 දරණ ගැසට් පත්‍රය

## කෙහෙල්ඇල්ල ගම්සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් 1973 වර්ෂයට මස් පිණිස සතුන් මැරීමට හා මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඒ අනුව බලපත්‍ර නිකුත්කිරීම ගැන කෙහෙල්ඇල්ල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතුව සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1973 ජනවාරි මස 20 වෙනි දින,
කටාන, දිසාගෙ වත්ත,
කෙහෙල්ඇල්ල ගම්සභා කාර්යාලයේදීය.

කේ. ඒ. සිරිසේන,
කෙහෙල් ඇල්ල ගම්සභාවේ සභාපති තැන.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ විස්තර | ස්ථානය |
|---|---|---|
| 1. පී. ඒ. පස්කාසියුස්, නැ. කළුවාධිරිප්පුව, කටාන ... | එළුහරක් මස්, එළු මස් සහ ඌරු මස් ... | දිසාගෙවත්ත |

2–141—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පණත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන අයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර, 1972 මාර්තු මස 10 වෙනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරණ ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට හේවාහිස්ස ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, හේවාහිස්ස ග්‍රාම්සභාව තීරණය කළ බව ප්‍රකාශ කරමි.

එච්. ඇම්. ආර්., බී. හේරත්,
සභාපති,
හේවාහිස්ස ගම්සභාව.

1973.1.10 දින,
හේවාහිස්ස ගම්සභා කාර්යාලය,
ගෝණදෙනිය,
අඹකොටේ.

## අතුරු ව්‍යවස්ථා

කලින් කළ සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

1. එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1 මෙම අතුරු ව්‍යවස්ථාවල් "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද

2. 1972 මාර්තු මස 10 වෙනි දින අංක 15,001 දරණ ගසට් පත්‍රයෙහි අංක 215 සහ 216 දරණ පිටුවල ගම්සභා සම්බන්ධයෙන් අන්තර්ගත කොට ඇති සියළුම අන්තරාදායක ව්‍යාපාර, අප්‍රසන්න ව්‍යාපාර සහ අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර පිළිගැනීමට.

2–1052—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත විස්තර දක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ 7 (2) (ඒ) දරන වගන්තිය යටතේ පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින්, ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ස්ථානයන්හි සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන, ගලේවෙල සුළු නගර සභා සීමාව තුළ යම් කෙනෙක් වේ නම්, තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම ගැසට් පත්‍රයේ පළ වී දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වන අධිකාරයේ 7 (2) (බී) දරන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ල. ජ. ද. සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1972 දෙසැම්බර් මස 28 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම් කරන ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. අයි. ජේ. හම්සා ලෙබ්බෙ ... ... ... | ජයතිලක මාවතේ අංක 1 දරණ මස් කඩය ... ... | හරක් මස් |
| 2. ඊ. බදුර්දීන් ... ... ... | ජයතිලක මාවතේ අංක 2 දරණ මස් කඩය ... ... | හරක් මස් |

2–302—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## එල්ලාවල ගම්සභාව

### ගෝඝාතක ආඥාපනත

ගෝඝාතන ආඥාපනතේ (272 වැනි අධිකාරයේ) 17 (i) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නියමිත නිලධාරී තැනවූද, රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල ගම්සභාවේ සභාපති තැනවූද, එච්. ඩී. චන්ද්‍රසිරි වන මම, ඉහත සඳහන් ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම 1973 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සම්පූර්ණයෙන් තහනම් කරමි.

එච්. ඩී. චන්ද්‍රසිරි,
එල්ලාවල ගම්සභාවේ සභාපති.

එල්ලාවල ගම්සභා කාර්යාලය,
නාමල්දෙනිය, පරකඩුව,
1973 ජනවාරි මස 20 වැනි දිනදී ය.

2–154—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

## පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු මැද ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා ඇති බවත්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම ගැන පොළොන්නරුව මැදපත්තු මැද ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වන්නේ කුමක් නිසා ද යන්න සඳහන් කරනු ලබන ලියකියවිලි පිටපත් දෙකකින් යුක්තව මෙම නිවේදනය ශ්‍රී ලංකා ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 වැනි අධිකාරයේ අංක 7 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දී සිටිනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳම | වෙළඳාම කරන ස්ථානය |
|---|---|---|
| පී.ටී. මොහොමඩ්, අංක 43, මුස්ලිම් ජනපදය, කදුරුවෙල, පොළොන්නරුව... | ගව මස් ... | මැදපත්තු මැද ගම්සභා පොදු වෙළඳ පොලේ හරක් මස් කඩය |

ලීලාරත්න විජේසිංහ,
පොළොන්නරුව මැදපත්තු මැද ගම්සභාවේ සභාපති.
(ජාතික රාජ්‍ය සභා නියෝජිත).

1972 දෙසැම්බර් මස 29 වැනි දින,
පොළොන්නරුව-පලුගස්දමන,
මැදපත්තු මැද ගම්සභා කාර්යාලයේ දී ය.

2–325—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## කොළොන් නාව පලාත් ආණ්ඩු සභාව

### සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත—334 වෙනි පරිච්ඡේදය 1973 වර්ෂයේ සුනඛ බදු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 334 වෙනි පරිච්ඡේදයේ 4 වෙනි ඡේදය අනුව කොළොන් නාව පලාත් ආණ්ඩු සභා සීමාව තුල සිටින සෑම බැල්ලියකට ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 2.50 ක් ද, සෑම බල්ලෙකුට ලියා පදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 1.50 ක් ද ගෙවීමට පනවා ඇති බවද, එම ලියා පදිංචි කිරීමේ ගාස්තුව 1973 මාර්තු මස 31 වන දිනට ප්‍රථම කොළොන් නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතු බවද, මෙයින් දැනුම් දෙමි.

සෝමසිරි ගලගෙදර,
සභාපති,
කොළොන් නාව පලාත් ආණ්ඩු සභාව.

1973 ජනවාරි 03 වන දින,
කොළොන් නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලය,
වැල් ලම්පිටිය.

2–743/1—73.02.02 දින අංක 45 දරන ගැසට්පත්‍රය

---

## කොළොන් නාව පලාත් ආණ්ඩු සභාවේ වර්ෂ 1973 සඳහා රථවාහන සහ සතුන් පිළිබඳ බදු—1939 වර්ෂයේ අංක 61 දරණ පලාත් ආණ්ඩු සභා ආඥාපනත

වර්ෂ 1939 අංක 61 දරණ පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 173 වෙනි ඡේදය අනුව කොළොන් නාව පලාත් ආණ්ඩු සභාව මගින් පසුගිය වර්ෂවල මෙන් රථවාහන හා සතුන් පිළිබඳ 1973 වර්ෂය සඳහා පහත සඳහන් බදු පනවා ඇති බවද, එම බදු මුදල් පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 176 යේ තුන්වන ඡේදය අනුව 1973 මාර්තු 31 දිනට පෙර කොළොන් නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලයට ගෙවිය යුතුයි.

සෝමසිරි ගලගෙදර,
සභාපති,
කොළොන් නාව පලාත් ආණ්ඩු සභාව.

1973 ජනවාරි 03 වන දින,
කොළොන් නාව පලාත් ආණ්ඩු සභා කාර්යාලය,
වැල් ලම්පිටිය.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් රථය, රෝද තුනේ මෝටර් රථය, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් හෝ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම අන් දමේ වාහනයකට ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට හෝ බයිසිකල් රථයකට ... ... | 3 | 0 |
| වෙළඳාම පිණිස පාවිච්චි කරණු ලබන්නේ නැති ඒ වූට ... ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයකට ... ... ... | 3 | 0 |
| තනි ගොනා බැඳි සෑම කරත්තයකට හෝ තිරික්කලයකට ... ... ... | 2 | 0 |
| සෑම අත් කරත්තයකට ... ... | 2 | 0 |
| සෑම ජින් රික්ෂෝවකට ... ... | 2 | 0 |
| සෑම අශ්වයෙකුට හෝ පෝනියෙකුට හෝ කොටළුවෙකුට ... ... ... | 2 | 0 |
| සෑම ගොනෙකුට හෝ බූරුවෙකුට ... | 1 | 0 |

2–743/2—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## මැදගම්පත්තු ගම් සභාව—මොණරාගල දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් කර තිබෙන ස්ථානයේ 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍රයක් ඉල්ලා ඉල්ලුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥාපනතේ 272 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත්කිරීම ගැන මැදගම්පත්තු ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දන්වීම් ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| එම්. අයි. ජෙමිල් ... ... ... | මැදගම ... ... | මැදගම ... | ගවමස් |
| එම්. අයි. හසන් ... ... ... | කොටබෝව, නන්නපුරාව ... | කොටබෝව ... | එම |
| එම්. අයි. සම්සුදීන් ... ... ... | බකිණිගහවෙල, මැදගම ... | බකිණිගහවෙල ... | එම |

ආර්. ඇම්. සුදුබණ්ඩා,
මැදගම්පත්තු ගම්සභාවේ සභාපති.

1973.01.10 දින,
ගම්සභා කාර්යාලය,
මැදගම.

2–929—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

## වැලිගම ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම් ඉදිරියේ සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන වැලිගම ගම්සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේනම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධවන්නේ අසවල් කරුණු මතයැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළතදී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | | ස්ථානය | | වෙළඳාම |
|---|---|---|---|---|---|
| 1. | කේ. බී. ඇම්. මහරූප් මයා., මදුරාගොඩ, දෙනිපිටිය | ... | මදුරාගොඩ, අබරන්රාලගෙ වත්ත නොහොත් අර්ෂඩතෝට්ටම් | ... | ගවමස් වෙළඳාම |
| 2. | කේ. බී. ඇම්. මහරූප් මයා., මදුරාගොඩ, දෙනිපිටිය | ... | මදුරාගොඩ, අබරන්රාලගෙ වත්ත නොහොත් අර්ෂඩතෝට්ටම් | ... | එළුමස් වෙළඳාම |

විමලට් වණිගසිංහ,
සභාපති,
වැලිගම ගම්සභාව.

1973 ජනවාරි 10 දින,
පැලැණේ පිහිටි
වැලිගම ගම්සභා කාර්යාලයේ දීය.

2–968—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### 1973 වර්ෂයේ වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා වූ මාතර නගරයේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත් (255 වැනි අධිකාරය වන) පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 166 වැනි වගන්තියේ කියවෙන පරිදි (252 වැනි අධිකාරිය වන) නාගරික සභා ආඥාපනතේ 235 (1) සහ (2) වගන්ති ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඒ. ඊ. බුල්ජන්ස්,
විශේෂ කොමසාරිස්,
මාතර නගරය.

1973 ජනවාරි මස 23 වැනි දින,
මාතර නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–146—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

---

## හොරණ නගර සභාව

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 476 වන අධිකාරයේ පිස්සු බලු උවදුර ආඥාපනතේ II වන ඡේදයේ ප්‍රකාර හොරණ නගර සීමාව තුළ පිස්සු බලු උවදුර පැතිර පවත්නා බව මෙයින් නිවේදනය කරමි.

හොරණ නගර සීමාව තුළ ඕනෑම ප්‍රසිද්ධ ස්ථානයක, මිදුලක හෝ ඉඩමක තිසි ආකාර නොබඳින ලද එසේ නොමැති නම්, භාරකරුවකු නොමැති බල්ලකු හෝ බැල්ලියක දුටු වහාම මගෙන් ලියවිල්ලකින් බලය ලත් ඕනෑම අයෙකු විසින් එවේලෙහිම විනාශ කිරීමට බලය තිබෙන බව මෙයින් දැනුම් දෙමි.

මෙම ප්‍රකාශය කලින් අවලංගු කරන්නට නොයෙදුනහොත්, 1973 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වලංගු වනු ඇත.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති, හොරණ නගර සභාව.

1973 ජනවාරි මස 23 වන දින,
හොරණ නගර සභා කාර්‍යාලයේ දීය.

2–151—73.02.02 දින අංක 45 දරන ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන සංශෝධිත ගාස්තු

**1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ**

(සැම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

**1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

**2.** පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමඟ කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාදා පෙරවරු 8 සිට දවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

**5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක්පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දොස් වලක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

**7. සැම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අහලකට හෝ ඉන් අඩුව ... ... ... | 20 | 0 |
| වැඩිවන අහලකට සැම හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

**අහලේ සැම කොටසකටම සම්පූර්ණ අහලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

**11. සැම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ "ගැසට්" පත්‍රය පළකරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සැම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දායක ගාස්තු* :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | ... | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 36 | 0 | ... | 42 | 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 43 | 50 | ... | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණ ය.**

***තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | මිළ ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී එක කොටසක් ... ... | 0 | 50 | ... | 0 | 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... | 1 | 0 | ... | 0 | 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළක දී, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 30 | ... | 0 | 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... | 0 | 60 | ... | 0 | 15 |

**දායක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|
| ජනවාරි | ... 73. 1. 5 සිකුරාද | ... 72.12.29 සිකුරාද දවල් 12.00 |
| | 73. 1.12 සිකුරාද | ... 73. 1. 5 සිකුරාද දවල් 12.00 |
| | 73. 1.19 සිකුරාද | ... 73. 1.12 සිකුරාද දවල් 12.00 |
| | 73. 1.26 සිකුරාද | ... 73. 1.19 සිකුරාද දවල් 12.00 |
| පෙබරවාරි | ... 73. 2. 2 සිකුරාද | ... 73. 1.26 සිකුරාද දවල් 12.00 |
| | 73. 2. 9 සිකුරාද | ... 73. 2.2 සිකුරාද දවල් 12.00 |
| | 73. 2.15 බ්‍රහස්පතින්ද | ... 73. 2. 9 සිකුරාද දවල් 12.00 |
| | 73. 2.23 සිකුරාද | ... 73. 2.15 බ්‍රහස්පතින්ද දවල් 12.00 |
| මාර්තු | ... 73. 3. 2 සිකුරාද | ... 73. 2.23 සිකුරාද දවල් 12.00 |
| | 73. 3. 9 සිකුරාද | ... 73. 3. 2 සිකුරාද දවල් 12.00 |
| | 73. 3.16 සිකුරාද | ... 73. 3. 9 සිකුරාද දවල් 12.00 |
| | 73. 3.23 සිකුරාද | ... 73. 3.16 සිකුරාද දවල් 12.00 |
| | 73. 3.30 සිකුරාද | ... 73. 3.23 සිකුරාද දවල් 12.00 |
| අප්‍රේල් | ... 73. 4. 6 සිකුරාද | ... 73. 3.30 සිකුරාද දවල් 12.00 |
| | 73. 4.11 බදාද | ... 73. 4. 6 සිකුරාද දවල් 12.00 |
| | 73. 4.19 බ්‍රහස්පතින්ද | ... 73. 4.11 බදාද දවල් 12.00 |
| | 73. 4.27 සිකුරාද | ... 73. 4. 19 බ්‍රහස්පතින්ද දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.